# ලෝකයේ ජනප්‍රියම පානය

අනුර සමරවීර

**තේ දළු වලින් පානයක් සකසා ගතහැකි බව සොයාගෙන ඇත්තේ චීන ජාති කයන් විසින් යයි විශ්වාසයක් පවතී. ඈත අතීතයේ එනම් ක්‍රි.පූ.2737 දී පම ණ "පෙනෙංගේ" නම් චීන අධිරාජ්‍යයා තේ සොයා ගත් බවට ද පිළිගැනීමක් තිබේ.**



**පානය ලෝකයේ වඩාත්ම ජනප්‍රිය ස්වාභාවික උණුසුම් පානය ලෙස හ ැඳින්වේ. කැමිලියාස් (Camellias)පවුලට අයත්වන මේ ශාකයේ උද්භිද විද්‍යා නාමය කැමිලියා සිනෙන්සිස් (Camellia Sinensis)වේ.**

තේ දළු වලින් පානයක් සකසා ගතහැකි බව සොයාගෙන ඇත්තේ චීන ජාති කයන් විසින් යයි විශ්වාසයක් පවතී. ඈත අතීතයේ එනම් ක්‍රි.පූ.2737 දී පම ණ "පෙනෙංගේ" නම් චීන අධිරාජ්‍යයා තේ සොයා ගත් බවට ද පිළිගැනීමක් තිබේ.

ලන්දේසි ජාතික වෙළෙන්දන් විසින් 17 වන සියවස මුල් කාලයේදී ප මණ යුරෝපා රටවලට තේ පානය හඳුන්වා දෙනු ලැබිනි. ඒ යුගයේදී ඔවු න් අතර ජනප්‍රියව පැවතියේ කෝපි පානයයි. එහෙත් කෝපි වගාව විනාශ වීමේ තර්ජනයකට ලක්ව තිබූ බැවින් තේ භාවිතයට හුරුවී ඇත.

තේ ප්‍රධාන වශයෙන් ප්‍රභේද දෙකකට බෙදා දැක්වෙයි.

1 එක වර්ගය

1. ඇසෑම් වර්ගය වශයෙනි. මීට අමතරව කාම්බෝජ වර්ගය යනුවෙන් ද වර්ගය ක් පසුකලක එක්වී තිබේ.

ක්‍රි.ව.1760 දශකය වන විට තේ පානය එංගලන්තයේ ද ජාතික පානයක් තත්ත්වයට පත්ව තිබූ අතර ඔවුන් එය නිවර්තන කලාපීය යටත් විජිත කරා ද ගෙන යනු ලැබිණි. මේ අනුව එවකට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් පැවති ලංකාවේ ද 185 9 වර්ෂයේදී මුල්වරට තේ පැළයක් රෝපණය කරන ලදී. එකල පේරාදෙණිය උද්භිද උද්‍යානයේ අධ්‍යක්‍ෂක ව කටයුතු කළ ජී.එච්.කේ.ත්වේට්ස් මහතාගේ උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස එය සිදු කරන ලද්දේ පේරාදෙණිය උද්භිද උද්‍යානයේය. ඔහු මෙරට තුළ තේ කලාව ජනප්‍රිය කරවීම සඳහා ක්‍රියාකාරීව දයක වූ පුද්ගලයන් අතරට ද එක්ව සිටී. කෙසේ වුවත් වානිජ වශයෙන් තේ වගාව මෙරටට හඳුන්වා දුන් පුද්ගල යා ලෙස ගෞරවාදරයට පත්ව සිටින්නේ "ජේම්ස් ටේලර්" නමැති වැවිලිකරුවා ය. 1835 දී ස්කොට්ලන්තයේ උපත ලද ඔහු 1851 දී ලංකාවට පැමිණියේ කෝපි වගාකිරීමේ අදහසින් වුවත' ඒ වනවිට කෝපි වගාව මලකඩ දිලීර රෝගයෙන් හානියට පත් වී පැවති බැවි න් තේ වගාව කෙරෙහි යොමුවිය. මේ සඳහා ඔහුට අදහස ලැබුනේ "කෝබ ල්" නමැති ඉංග්‍රීසි ජාතිකයකුගේ තේ වගාව හා නිෂ්පාදනය පිළිබඳ තො රතුරු අධ්‍යයනයෙන් බවට ද ඉතිහාසයේ සඳහන් වේ.

කල්කටාවෙන් මිල දී ගත් ඇසෑම් තේ බීජ යොදා ගනිමින් වර්ෂ 1867 දී මහනුවර දෙල්තොට ලූලෙකොන්දර වතුයායේ අක්කර 21 ක භූමි ප්‍රදේශයක ඔහු මේ තේ වගාව ඇරඹිය. ඔහු විසින් 1878 දී ලන්ඩන් වෙළෙඳ පොළට තේ රාත්තල් 25 ක් අපේ තේ අපනයනයද ඇරඹිණි.මෙ යුගයේදී ඉතා හොඳින් සිදු කළ මේ වගාව පිළිබඳ අවධානය යොමු කළ ඉංග්‍රීසි ජාතික වැවිලිකරුවන් රැසක් කෝපි වගාව ශීඝ්‍රයෙන් පැතිරිනි.

එහි ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ ප්‍රථම තේ වෙන්දේසිය 1883 ජූලි 26 ද සුප්‍රසිද්ධ තේ බ්‍රෝකර්වරුන් ගේ ආයතනයක් වන "සොමවිල" සහ සමාගමෙ කාර්යාලයේදී පැවැත්විනි. එලෙස ඇරඹි කොළඹ තේ වෙන්දේසිය ප්‍රවණ ාත්මක අතින් ලන්ඩනයේ තේ වෙන්දේසිය පවා අභිබවා යන තත්ත්වයට පත 'වූයේ මෙරට තේ ලොව හොඳම තේ ලෙසට ලෝකයේ ගෞරවාදරයට පත්වූ බැවිනි.

ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ ප්‍රධාන වශයෙන් කලාප 4 කට බෙද දැක්වි ය හැකි ය. එනම් උඩරට මැදරට, නැගෙනහිර මැදරට, බටයිර හා පහතරට වශයෙ නි. දැනට අක්කර 600,000 ඉක්මවා තේ වගාකර ඇති අතර අපේ පරිභෝජනයට අමතරව අපනයනය සඳහා තළු පෝ සී.ටී.සී.සාම්ප්‍රදායික තේ හා හරිත තේ යන වර් ගවලින් තේ නිපදවයි. අපේ පෝ වර්ග හමුවන්නේ මුහුදු මට්ටමින් අඩි 400 0 ට ඉහළින් පිහිටි ප්‍රදේශවලින් වීම ඊට හේතුවයි.

ශ්‍රී ලංකාවේ තේ වගාව සංවර්ධනය පලදුට හා අපනයනය ආදී කටයුතු සඳහා විවිධ ආයතන ක්‍රියාත්සක වේ. අපේ තේ වගාව ඉහළ නැංවීම හා ඒ පිලි ඉුදුව පර්යේෂණ කිරීම සඳහා 1925 වසරේදී "ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආ යතනය" පිහිටුවන ලදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය කුඩා තේවතු සංවර්ධන අධිකාරිය ආදී ආයතන ද අපගේ තේ වෙළඳම ඉහළ නැංවීම සඳහා දයකත්වය සපයයි.

තේ පිළිබඳව ප ළමුවෙන් ම සාහිත්‍ය ග්‍රන්ථයක් සිදු කර ඇත්තේ ද "ලූයු" නම් චීන සාහිත ෳකරු විසිනි. ක්‍රි.ව.780 දී පමණ පළ කළ එය බා.ජිං" නමින් හැඳින්වෙයි. එවැනිම තවත් ග්‍රන්ථයක් සියං නම් ලේඛකයා "වාලූ" නමින් එකොලොස්වන ස ියවෙස්දී පලකර තිබේ. අපරදිග සාහිත්‍යයෙන් මුල්වරට තේ ගැන සඳහන් ව ඇත්තේ වැනිසියානු ගත්කතුවරයකු වන ජයම්ටනිස්තා රමූසියෝ " විසිත' 1559 වසරේදී රචනා කළ ග්‍රන්ථයකිනි. මීට අමතරව ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන' ආදී රටවල සාහිත්‍යයේයි ද තේ පිළිබඳ සඳහන් වෙයි.

තේ වල රෝග සුව කිරීමේ ශක්තිය යනු වන බව වෛද්‍ය පර්යේෂණ පිළිබ ද සනාථ වී තිබේ. කොලෙස්ට්‍රෝල් මට්ටම පහත හෙලීමට මෙන්ම හෘදනාලිකා ආබාධ සමගර පිළිකා වර්ග පාලනය කිරීම ඒ අතරින් කිහිපයකි. තේ වල පවතින සෞභාදයී ගුණය පිළිබඳව විද්‍යාඥයෝ නව දුරටත් පර්යේෂණ පවත්වමින් සි ටි.

මුද්දර ලෝකයේ තේ කර්මාන්තය වෙනුවෙන් මුද්දර නිකුත් කර ඇත් තේ සීමිත ප්‍රමාණයක් වුවත් ඒ අතරට ශ්‍රී ලංකාවෙන් නිකුත් කළ මුද්දර රැසක් ඇතුළත්ව තිබීම සතුටට කරුණකි.තේ දළු නෙලීම මේ මුද්දර අතරට ව ැඩි වශයෙන් තේමා වී ඇති මාතෘකාව යි. මීට අමතරව අප රටින් නිකුත් වූ මුද්දර වලින් තේ පිළිබඳ පර්යේෂණ රස පරීක්‍ෂා කිරීම, තේ කර්මාන්තශාල ා, තේ වෙන්දේසි තේ අපනයනය ආදී තොරතුරු පිළිඹිබු වෙයි. ශ්‍රී ලංකාවේ තේ පිළිබඳ ලෝකය දැනුවත් කිරීමට මේ මුද්දර වලින් සිදුව ඇ ත්තේ අමිල සේවාවකි. ❑